S.V.P.P.පත්මකුමාර
අංක 124 /F/3
ඕලුපට්ටාව වැව පාර,
සියඹලාගොඩ,
පොල්ගස්ඕවිට.

04.04.2019

ප්‍රාදේශීය ඉංජිනේරු,
ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය,
ලංකා විදුලිබල මණ්ඩලය,
කටුවාන පාර,
හෝමාගම

මහත්මයාණෙනි

<u>අනතුරුදායක ලෙස ලිහිල් වී පවතින විදුලි රැහැන් නිසියාකාරව සකස් කරවා ගැනීම</u>

ඉහත සඳහන් ලිපිනයේ පදිංචි මාගේ නිවස ඉදිරිපස ඇති විදුලි රැහැන් වල පවතින ලිහිල් බව (slack) නිසා ඊට පහතින් පවතින දුරකථන රැහැන් වල එතී පැටලී ඇත.(ඇමුණුම 01 )

මේ පිළිබඳව මා විසින් කිහිප වරක් ම ඔබ තුමාගේ කාර්යාලයට පැමිණ දැනුවත් කල බව ඔබට මතක ඇතයි සිතමි.එහිදී ඔබ පවසා සිටියේ මෙය ආපදා අංශය දැනුවත් කිරීමෙන් පමණක් වුවද කල හැකි සරල කාර්යයක් බවයි. කෙසේ වෙතත් මෙය සතියක් තුල නිවැරදි නොවුනහොත් නැවත දැනුම් දෙන ලෙස පැවසීය .මා විසින් සති තුනක් පමණ බලා සිටියත් මෙය නිවැරදි නොකල බැවින් මීට සති දෙකකට පමණ පෙර නැවතත් ඔබට දුරකථන මාර්ගයෙන් දැනුම් දුන්නත් මේ වනතෙක් මෙම විදුලි රැහැන් සකස් කිරීමට ඔබගේ කාර්ය මණ්ඩලය විසින් සිදු නොකළ බව ඉතා කනගාටුවෙන් දන්වා සිටිමි.

ආපදා අංශය දැනුවත් කර සති 06 ගතවූ අතර ඔබ ව දැනුවත් කර සති 05 මේවන විට ඉක්ම ගොස් ඇති අතර. අනතුරු දායක ලෙස පවතින්නේ පහලින් ඇති උදාසීන (Neutral) රැහැන බැවින් එය එතරම් ගැටලුවක් නොවන බව යමෙකුට පැවසිය හැකිය. එසේ වුවත් දුරකතන රැහැන් වල ආවරණය පලුදු වුවහොත් එමගින් යම් අනතුරු දායක තත්වයක් ඇතිවිය හැකි බව විදුලි ඉංජිනේරුවෙකු වන ඔබට අමුතුවෙන් පැහැදිළි කල යුතු නැතැයි සිතමි.

මෙහිදී අනතුරක් සිදුවුවහොත් එහි වගකීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැරිය යුතු බව කාරුණිකව දන්වා සිටින අතර, මෙය ඉක්මනින් පිළිසකර කර දීම සඳහා කයුතු කරනු ඇතැයි විශ්වාස කරමි.

මෙයට විශ්වාසී වූ

S.V.P.P.පත්මකුමාර
0715311204 / 0777887176

පිටපත් 1. සභාපති -ලංකා විදුලිබල මණ්ඩලය (දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා )

ඇමුණුම 01

